**පදවිය ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**-----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 08 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුලි 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට පදවිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

**(අ)** ස්ථාවර වත්කම් අයිතමයන් 19 ක් අගය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** 2014 දෙසැම්බර් 31 දිනට ජල කර්මාන්ත ගබඩා ශේෂය රු.216,286 ක් වුවත් එම ගිණුම පොදු ලෙජරයේ නඩත්තු කර නොතිබුණි.

**(ඇ)** සභාව සතු මෝටර් වාහන 02 ක අගය ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඈ)** සභාව විසින් රු.9,254,065 ක් වැය කර ඉදි කරන ලද ගොඩනැගිලි හා වත්කම් වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

**(ඉ)** සභාව සතු කාර්යාල හා කඩ කාමර ගොඩනැගිලිවල සහ සභාව විසින් වැසිකිලි 07 ක් ඉදිකිරීමට දැරූ පිරිවැය හා ඊට අයත් බිම් ප්‍රමාණයන්හි වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

එකතුව රු.33,587,227 ක් වූ වත්කම්/වගකීම්/ආදායම් විෂයයන් 06 ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ/ආදායම් සනාථ කිරීමේ ලියවිලි/විසිතරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් ඌනතාවය රු.1,002,672 ක්වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.747,505 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

------------------------

**2.2.1 වරිපනම් බදු**

--------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශය තුල පිහිටි දියුණු කළ ප්‍රදේශ වශයෙන් හඳුනාගත් ප්‍රදේශ ප්‍රකාශයට පත් කර වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු**

--------------------------------

සභා බල ප්‍රදේශය තුල ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා බලපත්‍ර ගාස්තු අයකිරීම සඳහා ප්‍රතිපාදන 2013 දෙසැම්බර් 20 දින ගැසට් පත්‍රයේ පල කර තිබුණ ද සභා බල ප්‍රදේශයේ සවිකර තිබුණු ගාස්තු අයකල හැකි දැන්වීම් පුවරු විශාල සංඛ්‍යාවකින් සමාලෝචිත වර්ෂය තුලදී ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 මුද්දර ගාස්තු**

1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (ආ) වගන්තියේ විධිවිධාන පරිදි මුද්දර ගාස්තු ප්‍රමාණය හඳුනාගෙන ප්‍රාදේශීය සභා අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 උසාවි දඩ මුදල්**

සමාලෝචිත වර්ෂය ආරම්භය දක්වා හිඟ උසාවි දඩ මුදල් ප්‍රමාණය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාල හිඟ උසාවි දඩ මුදල් රු.45,533 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

1995 ඔක්තෝම්බර් 06 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ පරිදි සභා බල ප්‍රදේශය තුල අක්කර 90 ක වපසරියකින් යුත් සුසාන භූමි 18 ක් සම්බන්ධයෙන් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ 2006 නොවැම්බර් 14 දිනැති අංක PL/07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 9 හි යෝජනා හා නිර්දේශ අනුව සුසාන භූමි වල උරුමය හා අයිතිය නිගමනය කිරීමට, අයිතිය පවරා ගැනීමට, මායිම් නිශ්චිතව ලකුණු කර ගැනීම හා අවිධිමත් පරිහරණය පාලනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**4. පද්ධති හා පාලනය**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.

(ආ). ආදායම් පරිපාලනය.

(ඇ). වත්කම් කළමනාකරණය